ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
இலங்கை தேசிய கிறிஸ்தவ மன்றம்
National Christian Council of Sri Lanka

**එළැඹෙන ජනාධිපතිවරණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ප්‍රකාශයː**

නියමිත කලට නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත් වීම ප්‍රජාතන්ත්‍රානුකූල සමාජයක තීරණාත්මක ලක්ෂණයක් වන අතර, ව්‍යවස්ථානුකූල ව මේ වසරෙහි දී ජනාධිපතිවරණය පැවැත් විය යුතු ය යන්න නැවත අවධාරණය කළ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ පැසසුමට ලක් වෙයි. නියමිත කලට නිදහස් හා සාධාරණ මැතිවරණ පැවත්වීම ප්‍රජාත්ත්‍රවාදී සමාජයක මූලික ලක්ෂණයක් වන අතර, ජනතාව මෙය උද්‍යෝගයෙන් අභ්‍යාස කිරීම අත්‍යවශ්‍ය ය.

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL) ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ඇතුළත් ස්වෛරීභාවය කඩිසරව හා වගකීමෙන් යුතුව බාවිතා කරන ලෙසයි. මේ සඳහා රට මුහුණ පා ඇති දේශපාලන හා ආර්ථික අර්බුද පිළිබඳ දැනුවත් භාවයත්, පැවැත් වෙන්නට නියමිත ජනාධිපති හා පාර්ලිමේන්තු මැතිවරණවලට ඉදිරිපත් වන පක්ෂ හා අපේක්ෂකයන් පිළිබඳ විවේචනාත්මක තක්සේරුවකුත් අවශ්‍ය ය. මෙය බහුපාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදය සහිත පාලන ක්‍රමයක අත්‍යවශ්‍ය අංගයකි.

සමාජයේ සෑම අංශයකට ම බලපා ඇති වත්මන් ආර්ථික අර්බුදයේ මූල හේතුව දේශපාලනික බව ජනතාවට සිහිපත් කර දෙන්නට ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය නොපැකිළෙයි. රට ම ග්‍රහණයට ගෙන වසංගතාකාරයෙන් ඔඩු දිවූ ආර්ථික අවකළමනාකරණය, අතිදූෂණය, කිසිත් ආර්ථික සාධාරධෑකරණයක් කළ නොහෙන නිෂ්ඵල ව්‍යාපෘති උදෙසා මහා පරිමාණ වියදම් නිදැල්ලේ සිදු වූයේ දේශපාලන බලය ක්‍රියාත්මක කරන්නන් පිළිබඳ අප්‍රමාණවත් සංවරණ හා තුලනත්, විධායකයේ ගුණදොස් විචාරීමේ බලපෑම් රහිත නිරීක්ෂණ හා පරීක්ෂාත්, නීති සම්පාදන මණ්ඩලයේ අඩුපාඩු නිසා පලදායී වගවීමේ යාන්ත්‍රණ නොතිබීමත් නිසා ය.

ප්‍රජාතන්ත්‍රීය සම්මතයන් හා ව්‍යවස්ථාගත ව්‍යවස්ථා පද්ධතිය හෑල්ලු වට ලක් කෙරෙන තනි පුද්ගලයකු අත බලය අයුතු ලෙස සංකේන්ද්‍රණය වන බලසම්පන්න විධයක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම උදෙසා වන සිය ඉල්ලීම ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය යළිත් අවධාරණය කරයි. බලගතු විධායක ජනාධිපති ක්‍රමය අනෙකුත් ප්‍රජාතාන්ත්‍රික ආයතන ද අන්තරායයේ හෙළයි. ඉකුත් වකවානුවල ජනාධිපති අපේක්ෂකයන් ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාරවල දී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම අරබයා කොතෙකුත් පොරොන්දු දුන්න ද ඔවුන් බලයට පත් වූ පසු ඒ පිළිබඳ ව සැහැල්ලු මතික ව නොසලකා අමතක කරනු අපි අත්දැක ඇත්තෙමු. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සහායය පළ කරනු වස් කැප වන ලෙස මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත් වන සියලු ම අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටින ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, බලයට පත් වුවහොත් නිශ්චිත කාල රාමුවක් ඇතුළත ඒ සඳහා පියවර ගන්නා ලෙස ද අවධාරණය කරන්නී ය.

ජනාධිපති අපේක්ෂකයන් රටට බලපාන තීරණාත්මක කරුණු සම්බන්ධ සිය ස්ථාවරයන් සහ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කළ යුතු ය. මෙයට වත්මන් ආර්ථික අර්බුදයට විසඳුම්, දණ්ඩමුක්තිය ද ඇතුළු නීතියේ ආධිපත්‍යය තහවුරු කරන අයුරු, කාර්යක්ෂම හා ස්වාධීන රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීමට ගන්නා පියවර, දූෂණය වැලැක්වීමට අදාළ ආයතන හා ප්‍රතිපත්ති කෙසේ සම්පාදනය කෙරේ ද, තිරසර සංවර්ධනය ස්ථාපිත කරනු පිණිස ගන්නා ක්‍රියාමාර්ග යන දෑ ඇතුළත් විය යුතුය.

ජනවාර්ගික යුද්ධය හමාර වී 15 වසක් ඉකුත් වී තිබුණ ද තව දුරටත් පැසවමින් පවත්නා ජනවාර්ගික ගැටළුවට විසඳුම් පිණිස වන තම ප්‍රතිපත්ති පැහැදිලි ව ප්‍රකාශයට පත් කරන ලෙස සියලු ම ජනාධිපති අපේක්ෂකයන්ගෙන් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය ඉල්ලා සිටියි. උතුරු - නැගෙනහිර දෙමළ ජනතාවගේ නීත්‍යානුකූල දුක්ගැනැවිලි විසඳීමට විටින් විට බලයට පැමිණි ආණ්ඩු අපොහොසත් වූ නිසා යුද්ධයකට හා අන්‍යෝන්‍ය ඈත් වීමකට රටෙහි ජනවාර්ගික කොටස් තල්ලු වූ ආකාරය වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය පෙන්නා දී තිබේ. ජනවාර්ගික ගැටළුව විසඳිය හැක්කේ උතුරු - නැගෙනහිර ජනතාවගේ දේශපාලන දුක්ගැනැවිලි සහ ඔවුන් විඳි වෙනස් කොට සැලැකීම්වලට සාධාරණ ප්‍රතිචාර දක්වන දේශපාලන විසඳුමකින් පමණක් බව අපගේ විශ්වාසය යි. එමෙන් ම වතුකරයේ මෛලයහ මක්කල් ජනතාවගේ දුක්ඛිත තත්ත්වය ද අප අමතක නොකළ යුතු ය. දේශපාලන විසඳුමකට උතුරු - නැගෙනහිර දෙමළ ජනතාව වෙන ම ජාතියක් ලෙස පිළිගැනීමත්, ඒ දෙපලාතට ප්‍රමාණවත් ස්වයං පාලනයක් සහ බලය බෙදා හැරීමක් එක්සත් රටක රාමුව ඇතුළත ක්‍රියාත්මක කිරීම වුවමනා ය. දශක

#368/6, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.
Telephone: +94 (11) 2671723 Fax: +94 (11) 2671721
E-Mail: info@nccsl.org | Website: www.nccsl.org

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
இலங்கை தேசிய கிறிஸ்தவ மன்றம்
National Christian Council of Sri Lanka

ගණනාවක් තිස්සේ ආත්ම ගරුත්වය හා අනෙක් මානව අයිතීන් නො දී පැහැර තිබෙන මෛලයහ මක්කල් ජනතාවගේ සැබෑ අපේක්ෂාවන් ආමන්ත්‍රණය කිරීමද වැදගත්ය.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, දේශපාලන සිරකරුවන්ට යුක්තිය, ඝාතන, ලිංගික අපරාධ සහ අනෙකුත් බරපතල යුදකාලීන කුරිරුකම් අරබයා පිළිගැනීම හා වගවීම වැනි වාර්ගික ගැටුමේ සහ යුද්ධයේ ප්‍රතිවිපාකවලට ප්‍රතිචාර දැක්වීමට අව්‍යාජ මුලපිරීම් තිබිය යුතු ය. ආරක්ෂක හමුදාව සහ විවිධ රාජ්‍ය ආයතන මඟින් අඛණ්ඩ ව සහ අලු තින් ඉඩම් අත්පත් කර ගැනීම, යුද්ධයෙන් මිය ගිය අය සිහිපත් කිරීමේ දී බාධා කිරීම්, සීමා කිරීම් හා බිය ගැන්වීම් හා විසම්මුතිය මර්දනය කිරීම ඇතුළු සිදු වෙමින් පවත්නා උල්ලංඝනයන් ආමන්ත්‍රණය කිරීම ද එයට අන්තර්ගත වුවමනා ය.

තමන් නියෝජනය කරන පක්ෂ හා ආධාර කරන අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරනු ලබන මත හා සැලැසුම් කෙරෙහි නිසි අවධානය යොමු කරමින් වගකීමෙන් යුක්ත ව ඡන්ද බලය භාවිත කරන මෙන් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය සමස්ත ලාංකික ප්‍රජාවගෙන් ඉල්ලා සිටියි. ඔවුන් ඡන්ද අපේක්ෂකයන්ගේ හැසිරීම් ඉතිහාසය විමසුමට ලක් කළ යුතු අතර, බරපතල අපරාධ, මානව හිමිකම් කඩ කිරීම්, දූෂණයෙහි නියැළීම්, ජාතිවාදී නොපනත්කම්ලට මැදිහත් වීම්, විසම්මුතිය මර්දනය කිරීම් වැනි චෝදනා සහිත අපේක්ෂකයන් ප්‍රතික්ෂේප කළ යුතු ය. ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය විශ්වාස කරනුයේ ඡන්ද බලය ඡන්දදායකයනට, සියලු දෙනාට ම යහපත් රටක් සහතික කරනු පිණිස, ආන්තිකත්වයට හා අවදානමට ලක් වූ සියලු කණ්ඩායම් හා සමඟ එක් ව දයානුකම්පාව හා සහයෝගීතාව පළ කිරීමේ ආධ්‍යාත්මික - දේශපාලන අවස්ථාවක් බව යි.

2024 – 07 – 16

අත්සන් තබන ලද්දේ :

අති ගෞරවණීය ආචාර්ය වී. පද්මදායාලන් රදගුරුහිමි, සභාපති - ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය සහ රදගුරු, යාපනය දියෝකීසිය, දකුණු ඉන්දීයානු සභාව

අති ගෞරවණීය දුෂාන්ත රොඩ්රිගෝ රදගුරුහිමි, කොළඹ රදගුරුතුමා, ලංකා සභාව, කොළඹ දියෝකීසිය

අති ගෞරවණීය නිෂාන්ත ප්‍රනාන්දු රදගුරුහිමි, කුරුණෑගල රදගුරුතුමා, ලංකා සභාව, කුරුණෑගල දියෝකීසිය

ගෞරවණීය ඩබ්. පී. එබනේසර් ජෝසෆ් දේවගැතිතුමා, මහානායක, ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාව

ගෞරවණීය ලක්මාල් විජේරත්න දේවගැතිතුමා, සභාපතිතුමා, ශ්‍රී ලංකා ක්‍රිස්තියානි රෙපරමාදු සභාව

ගෞරවණීය විලි රණසිංහ දේවගැතිතුමා, සභාපතිතුමා, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය

ගෞරවණීය සමන් පෙරේරා දේවගැතිතුමා, සභාපතිතුමා, ශ්‍රී ලංකා ප්‍රෙස්බිටීරියානු සභාව

කර්නල් නිහාල් හෙට්ටිආරච්චි, ප්‍රාදේශිය මූලිකතුමා, ශ්‍රී ලංකා ගැළවීමේ හමුදාව

ගෞරවණීය ක්‍රිෂෝකුමාර් හැන්ඩි දේවගැතිතුමා, සභාපතිතුමා, ලංකා දේවසභාව

ගෞරවණීය හරිම් පීරිස් දේවගැතිතුමා, වැඩබලන සභාපතිතුමා, සිවුචතුරස්‍ර දේවසභාව

සාමයික ආයතන :

තරුණ ක්‍රිස්තියානි සංගමය, තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය, ශ්‍රී ලංකා ශිෂ්‍ය ක්‍රිස්තියානි ව්‍යාපාරය, ශ්‍රී ලංකා බයිබල් සංගමය, ක්‍රිස්තියානි සාහිත්‍ය සංගමය, ජීවිතාලෝකය, ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය පිළිමතලාව, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, යෞවන කිතුමග

ගෞරවණීය සුජිතර් සිවනායගම් දේවගැතිතුමා, මහා ලේකම් තුමා,
ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

#368/6, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.
Telephone: +94 (11) 2671723 Fax: +94 (11) 2671721
E-Mail: info@nccsl.org | Website: www.nccsl.org